
# සෙම්බු නැටුම හඳුනා ගනිමු

ඒ ඒ රටවලට ආවේණික ලක්ෂණ අනුව නිර්මාණය වී ඇති ගැමි නැටුම් ලෝකයේ සෑම රටකම දැකිය හැකිය. ඒ වුවත් ද්‍රවිඩ ජනතාවගේ ගැමි නැටුම් හා සිංහල ජනතාවගේ ගැමි නැටුම් සුවිශේෂී වේ. ඊට හේතුව වන්නේ සිංහල ගැමි නැටුම් හා සමාන ද්‍රවිඩ ගැමි නැටුම් ඇති බැවිනි.

ඉහත රූපය හොඳින් නිරීක්ෂණය කරන්න. එම නැටුම අපේ ගැමි නැටුමකට සමාන බව ඔබට පෙනී යනු ඇත. ඉහත රූපයේ ඇත්තේ ද්‍රවිඩ නැටුමක් වන සෙම්බු නැටුමකි. සරල පද භාවිතා කරමින් ද්‍රවිඩ ගායනා අනුව විනෝදාස්වාදය සඳහා මෙම නැටුම නිර්මාණය කොට ඇත.

ක්‍රියාකාරකම

1. ද්‍රවිඩ සෙම්බු නැටුම හා සමාන සිංහල ගැමි නැටුම කුමක්ද?
2. සෙම්බු නැටුම සඳහා භාවිතා කරන උපකරණය ලියන්න.
3. සෙම්බු නැටුමක් නිර්මාණයේදී යොදාගත හැකි ක්‍රියාකාරකම් මොනවාද?
4. ගැමි නැටුම්වල දැකිය හැකි විශේෂ ලක්ෂණ දෙකක් ලියන්න
5. වැඩිහිටි උදව් ඇතිව අන්තර් ජාලය ඇසුරු කරගෙන සෙම්බු නැටුමක් නරඹන්න.